
මලී සහ සමනල පවුල
W.M. ජේසඳි සෙතුල්‍යා වීරකෝන්

# මලී සහ සමනළ පවුල

W.M.ජෙසදි සෙතුල්යා වීරකෝන්

කතෘ ගේ වෙනත් කෘති

- පුංචි මගේ කවි සිතිවිලි

මහ/මහමායා බාලිකා විද්‍යාලය ,මහනුවර.
4 – A
පළමු මුද්‍රණය 2025.02.08

ISBN 978-624-208-243-1

# පිදුම

පෙර පාසල් අවදියේ පටන් මේ දක්වා
මා හට හමුවූ සියළුම
ගුරු මව්වරුන්ටත් , ගුරු පියවරුන්ටත් ,
මහමායා ගුරු මෑණියන්ටත් ,මාගේ ආදරණීය
දෙමාපියන්ටත් ,
මේ පොත් පිංච ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන් හෙරණගත්කරණීv ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ආදරනීය මලී

**ඔන්න එකෝමත් එක ගමක පුංචි ගෙදරක් තිබුණා. ඒ ගෙදර ජීවත්  උනේ අම්මා කෙනෙකුයි මලී කියලා පුංචි ගැහැණු ළමයෙකුයි විතරයි.**

**එයාලා හරිම දුප්පත්. නමුත් මේ දෙන්නා හරිම සතුටින් තමයි ජීවත් වුණේ.**

**ඔහොම ටික කාලයක් යද්දී මලීගේ අම්මා**
**හොදටම අසනීප වුණා.**
**ඉතින් ඊට පස්සේ මලීගේ අම්මා, මලීට කතා කරලා මෙහෙම කිව්වා.**



“දුවේ, ඔයාට පුළුවන් නම් එහා ගමේ ඉන්න වෙද මහත්තයට මේ සල්ලි ටික දීලා, මට බෙහෙත් ටිකක් ඉල්ලගෙන එන්න පුළුවන් ද?”

“ හරි අම්මේ. මම යන්නම් “ මලී කීවා.
වෙද මහත්තයා හොයාගෙන එහා ගමට යන්න පිටත් උණා.

හැබැයි ඉතින් එහා ගමට යන්න නම් ගොඩක් අමාරුයි. ඒ මොකද කියනවනම්, එහා ගමට යන්න ඕන රුස්ස කැලයක් මැදින්.

ඒ කැලේ ඇතුලේ භයානක සත්තු ඉන්නවා, විස කටු සහිත ගස් තියෙනවා. ඉතින් මලී මේ ඔක්කොම පහු කරගෙන ඉදිරියට ම ගියා.

ඊට පස්සේ මලීට කොහොම හරි ඒ වෙද මහත්තයා හොයාගන්න පුළුවන් වුණා.

හැබැයි ඉතින් මේ වෙද මහත්තයා හරිම ලෝභ කෙනෙක්. ඒ බවක් නොදන්න මලී වෙද මහත්තයාට රුපියල් 100 ක් දීලා මෙහෙම කිව්වා.

“ අනේ වෙද මහත්තයෝ, මගෙ අම්මාට හොදටම අසනීපයි. ඉතින් මට කොහොම හරි මගෙ අම්මව සනීප කරගන්න බෙහෙත් ටිකක් දෙන්න පුළුවන් ද ? ”

“හා හා මේ මුදල නම් මදි ළමයෝ…
අම්මව සනීප කරලා දෙන්න මට තව මුදලක් ඕනි.
මොකද කියන්නේ? ” වෙද මහත්තයා ඇහුවා.

“හොදයි වෙද මාමේ, එහෙනම් මම ගිහින් ඉක්මනින් එන්නම්. ” කියා මලී එතනින් යන්න ගියා.

.

මලී යන ගමන් මෙහෙම හිතුවා. “බෙහෙත් ගන්න බැරි වුණා කියලා අම්මා ට කියලත් බෑ. නොකියන්නත් බෑ.”

මලී කල්පනා කලා.
ම් ම් ම්..... මොකද කරන්නේ ?

ආ මට හොද අදහසක් ආවා. අපේ ගෙදර තියෙන පලතුරු වලින් ටිකක් කඩාගෙන පොලට අරගෙන ගිහින් විකුණලා වත් මම මුදල් ටිකක් හොයාගන්න ඕනි.
කියලා මලී හිතුවා.

කොහොම හරි අම්මව සනීප කරගන්න ඕනි කියලා හිත හිත මලී ගෙදර ගියා.
මලී අම්මාට හොරෙන්ම පලතුරු ටිකක් කඩාගෙන පොලට අරගෙන ගිහින් විකුණලා සල්ලි ටිකක් හොයා ගත්තා



මලී සල්ලි ටික ගණන් කරලා බැලුවා. හැබැයි ඉතින් පොඩි ප්‍රශ්නයක්. වෙද මහත්තයා කියපු ගාණ තිබුනේ නැහැ.

මලී ආපහු ටිකක් කල්පනා කරලා බැලුවා. ඊට පස්සේ මලීට මතක් වුණා, එයා ගෙ කැටයක පොඩි මුදලක් එකතු කරගෙන තියෙනවා කියලා.

එයා කැටය කඩලා ඒ මුදල ගණන් කරලා බැලුවා. මලීට හරි සතුටුයි. අවශ්‍ය මුදල හම්බ වුණා.

මලී ඉක්මනින්ම වෙද මහත්තයා හොයාගෙන ආපහු රුස්ස කැලේ ඇතුලට ගියා.

වෙද මහත්තයා මුණ ගැහුණු මලී, අම්මාට ඕනි කරන බෙහෙත් ටික මුදල් දීලා ඉල්ලගත්තා.

ඉක්මනින් ම මලී මහන්සි නොබලා ගෙදර දුවගෙන ආවා.
බෙහෙත් ටික අම්මාට දුන්නා.
ටික දවසක් යනකොට අම්මගේ අසනීපය සුව වුණා.

අසනීපය සුව වුනාට පස්සේ මලී එයාගෙ අම්මාට තමන් කල හපන් කම ගැන විස්තර කලා.

ඒක අහගෙන හිටපු අම්මා ගෙ ඇස්වල කඳුළු පිරුණා. “ මගෙ රත්තරන් දුව ” කියමින්
අම්මා මලීව තදින් බදාගත්තා.
මලී අම්මත් එක්ක නැවතත් සතුටින් ජීවත් වුණා.

# සමනළ පවුල

එකෝමත් එක වනාන්තරයක පුංචි සමනළ පවුලක් ජීවත් වුණා.
ඒ පවුලේ හිටියේ සමනළ අම්මයි, තාත්තයි, අයියයි, නංගියි හතර දෙනා. මේ හතර දෙනා හරිම ආදරයෙන් හිටියේ.

එක දවසක් සමනළ අම්මයි, තාත්තයි, අයියයි මල් පැණි සොයන්න ගෙදරින් ටිකක් ඈතට ගියා.

“දුවේ, කොහෙවත් යන්නේ නැතිව අපි එනකල් ගෙදරට වෙලා ඉන්න. අපි ඉක්මනින් ම එන්නම්.”

අම්මා කිව්වා.

ටික ටික වෙලාව ගත උණා. සමනළ නංගිට ටිකක් කම්මැලි හිතුණා.

එයා වටපිටාව බලන්න ආස නිසා ගෙදරින් එළියට ගියා. එයාටත් නොදැනීම එයා ගොඩක් දුර ඇවිත්.

ලස්සන වතුර තියෙන වැවක් එයා දැක්කා. ලස්සනට නෙලුම්, මානෙල් මල් පිරිලා තිබුනේ.

මල් සුවදත් එක්කම සමනළ නංගිට පොඩි බඩගින්නක් ආවා. පැණි ටිකක් බොන්න හිතාගෙන එයා වැව දිහාවට ඉගිලෙන්න පටන් ගත්තා.

අම්මා ගෙදරින් යද්දි කියලා ගියේ ගෙදරට ම වෙලා ඉන්න කියලා. දැන් නංගි ට ඒක අමතක වෙලා.

එයාට අනතුරක් වෙන්න යන බව නොදැන එයා නෙලුම් මලක් ලගට ලං උණා විතරයි,
ලොකු ගෙම්බෙක් සමනළ නංගි අල්ලගන්න එයාගේ ඉස්සරහට පැන්නා.
එයා හොදටම බය උණා. බයටම "අම්මේ,
මාව බේරගන්න " කියලා කෑ ගැහුවා.



ඒ වෙද්දිත් එයාගේ අම්මයි, තාත්තයි, අයියයි තුන් දෙනාම සමනළ නංගි හොය හොයා හැමතැනම යන ගමන් හිටියේ.

සමනළ අයියට ඇහුණා නංගිගේ සද්දේ. එයා ඉක්මනට වැව දිහාට පියාඹලා ගිහින් නංගිව බේරගත්තා.

"අම්මේ මට සමාවෙන්න. මම අයෙත් කවදාවත් අම්මාට අකීකරු වෙන්නෙ නෑ."
සමනළ නංගි ඇඬුවා.

"ඔයා අද හොද පාඩමක් ඉගෙන ගත්තා නේද?

දෙමාපියන් දරුවන්ට අවවාද කරන්නේ තරහට නෙවෙයි. තව ටික වෙලාවක් ගියානම් ඔයාට අනතුරක් වෙන්නත් තිබුණා."

සමනළ නංගි එදා ඉඳලා දෙමාපියන් ට කීකරු හොද දරුවෙක් උණා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.   පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.  මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.  මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ
සෙනෙවිරත්න මහලේකම්

ISBN   978-624-208-243-1